# පෙර වදන

ශ්‍රී ලංකා ධීවර අංශ සංවර්ධන ව්‍යාපෘතිය, ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර උපයෝගී කොටගෙන, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ධීවර සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන සය අවුරුදු ව්‍යාපෘතියකි. එහි වැදගත් කාර්යයක් වන දියඹ මුහුදේ මත්ස්‍ය සම්පත් ගවේෂණය ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (නාරා) විසින් ආරම්භ කොට ඇත. මෙම ගවේෂණයේ අරමුණු නම්

*ටූනා මසුන්, මෝරුන්, කොප්පරුන් සහ තලපත් වැනි දියඹ මුහුදේ විශාල සාමුද්‍රික මසුන්ගේ ව්‍යාප්තිය, සුලභතාවය, කාලීන බව පිළිබඳ දැනුම ලබා ගැනීම.*

*වාණිජමය වටිනාකමින් යුත් මත්ස්‍ය විශේෂ වල ප්‍රමාණය තීරණය කිරීම සහ එහි ප්‍රශස්ථ අස්වනු මට්ටම නිගමනය කිරීම.*

*දියඹේ සම්පත් නෙලා ගැනීම සඳහා වඩාත් උචිත ආම්පන්න (කරමල් දැල්, මරුවැල් සහ පුඩුපන්න) සහ සුදුසු යාත්‍රා වල විශාලත්වය නිගමනය කිරීම.*

*විවිධ කාලයන්හී, විවිධ ප්‍රදේශවල වඩාත් උචිත මෙන්ම ආර්ථික වශයෙන් යහපත් යාත්‍රා සහ පන්න සංයෝජන හඳුනා ගැනීම.*

ස්වදේශීය යාත්‍රා තුනක් උපයෝගී කොටගෙන 1995 සැප්තැම්බර් සිට 1997 අගෝස්තු දක්වා දෑවුරුදු කාලසීමාවක් තුළ සම්පත් ගවේෂණය කරගෙන යනු ලැබේ. මෙහි ප්‍රගතිය හා ප්‍රතිඵල තෙමසකට වරක් පලකෙරෙන ප්‍රවෘත්ති සංග්‍රහයක් මගින් ධීවරයින්ට හා ධීවර කර්මාන්තයෙහි යෙදෙන්නන්ට ඉදිරිපත් කෙරෙනු ඇත.

එම්. එච්. ගුණවර්ධන
*සභාපති*
**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය.**
**කාකදූපත, මට්ටක්කුලිය, කොළඹ 15.**